// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1504/27 – 2007 ජුලි 06 වැනි සිකුරාදා – 2007.07.06

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### රේගු නිවේදනය

රේගු ආඥාපනත (235 වැනි අධිකාරය)

2003 අංක 2 දරන රේගු (සංශෝධන) පනතේ "ඉ" උපලේඛනයේ 10 වැනි වගන්තිය යටතේ කරනු ලබන නියෝගය

2003 අංක 2 දරන රේගු (සංශෝධන) පනතේ "ඉ" උපලේඛනයේ 10 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව, මහින්ද රාජපක්ෂ, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය වන මම අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිතව, සංයෝජිත භාණ්ඩ වර්ගීකරණය පද්ධතියේ ශීර්ෂ අංක 87.01, 87.02, 87.03, 87.04 හා 87.11 යටතේ වර්ගීකරණය කරනු ලබන පාවිච්චි කළ මෝටර් රථ ආනයනය කරනු ලබන අවස්ථාවේදී ඒ සඳහා රේගු බදු හා අනෙකුත් ගාස්තු අය කිරීම සඳහා වටිනාකම ගණනය කිරීම ගරු හිටපු මුදල් අමාත්‍යතුමා විසින් 2003 ජනවාරි 30 වැනි දින නියෝග කරනු ලදුව, 2003 ජනවාරි 31 දින ප්‍රසිද්ධියට පත් කරන ලද අංක 1273/21 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාරව සිදු කළයුතු බව මෙයින් නියෝග කරමි.

මෙම නියෝගය 2007 ජුලි 07 දින සිට වසරක කාල සීමාවක් සඳහා බලපැවැත්වේ.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

07–461

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.